# හරය

............හත් වන පිටුවෙන්

## ඩයස්පෝරාව.....

කෙසේ වෙතත් ලංකාණ්ඩුව ප්‍රායෝගික ලෙස දියත් කර ඇති අය-වැය ප්‍රතිපත්තියත්, ඉංදියාව සමඟ ඇති කරගෙන තිබෙන එකඟත්වයත්, සමඟ ඩයස්පෝරාවේ මේ පෙළගැස්මත් යන ත්‍රිත්වය එකතු වූ කල IMF ණයේ තුන්වන කාර්තුව පමණක් නොව GSP + සම්බන්ධයෙන් ද "යහපත්" තීරණයකට එළැඹීමට යුරෝපා සංගමයටද හැකි වෙතොත් එයද විමතියට හේතුවක් නොවන්නේ ම ය.

බැන්කි මූන් ගේ කමිටුව ආණ්ඩුවේ පමණක් නොව විමුක්ති කොටි සංවිධානයේ ද යුධ අපරාධ පිළිබඳව වගකීම සොයා බලන්නක් බවද අමතක නොකළ යුත්තකි. මේ අතර එහි ප්‍රතිඵල ද දැන් නම් අනුමාන කිරීමට නොහැක්කේ නොවේ.

............පළමු වන පිටුවෙන්

## යාපනයේ වැන්දඹු.....

බිහිසුණු අවස්ථාවන් මතකයේ රඳවාගෙන. සමහරුන්ට තවමත් තේරුමක් නෑ තම දරුවන්ට කෙසේ කියන්නද ඔවුන්ගේ ආදරණීය පියා නැත්තේ ඇයි කියා. ඔවුන්ගේ දරුවන්ට පැහැදිලි කරන්න අපහසුයි නන්නාදුනන බෝම්බ පහරකට ලක් වීමෙන් කිසිම තේරුමක් හෝ හේතුවක් නැතිව පියා මරණයට පත් වීම ගැන.

කරුණු වඩාත් නරක අතට හැරී තිබෙන්නේ සමහර අගතියට පත් වැන්දඹුවන් තමන්ගේම දෙමළ සමාජය තුළ පීඩාවට පත් වන නිසයි. තම ස්වාමිපුරුෂයන් අහිමි වූ කාන්තාවන්ව ඉහළ දෙමළ සමාජයේ ප්‍රීති උත්සවවලට ආරාධනා කරන්නේ නැහැ. ඔවුන්ව මග හරිනවා, නැත්නම් ඒවාට වැද්දගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා.

අපි කියන්නේ මේවා වෙනස් කල යුතුයි. අපි මේ කාන්තාවන්ට උදව් කළ යුතුයි. ඔවුන්ට සමාජයේ ස්ථානයක් හිමි වන ආකාරයෙන් ජීවිතය දෙස අලුත් විධියකට බලන්න පුළුවන් වන තත්වයක් වර්ධනය කරගන්න අපි උදව් විය යුතුයි. අපි ඔවුන්ට කාන්තාවක් හා මවක් ලෙස ලැබිය යුතු ශ්‍රේෂ්ඨ ගෞරවනීය ස්ථානය ලබා දිය යුතුයි....."

හත් වන පිටුවෙන්..........

## ඉන්දියාවේ විශේෂ ආර්ථික........

එරෙහි ජනතා කොමිටියේ රැස්වීමට ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) [CPI (M)] මැරයන් සහ පොලීසිය විසින් පසුගියදාක වෙඩි තැබීය. සාමාන්‍ය ආකාරයටම මෙම රැළියේද කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉදිරියෙන්ම සිටි බැවින් ඔවුහු මෙම ප්‍රහාරයේ ප්‍රධාන ඉල්ලකය විය. ජනයා මේ අවස්ථාවේදී පසුබැස ගොස් නැවත සංවිධානය වී සම්ප්‍රදායික අවිවලින් සන්නද්ධව පැමිණ කළ පළිගැනීමේදි ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) කාඩර්වරු ගණනක්ම මිය ගියෝය. ඉන්දීය කොමියුනිස්ට් පක්ෂ (මාක්ස්වාදී) නායකයන්ගේ කාර්යාලවලට පහර එල්ල වූ අතර එවා ගිනි තබා ඔවුන්ව ප්‍රදේශයෙන් එළවා දැමීය. ඒ සමඟම ලාල්ගාර් ප්‍රදේශයේ පිහිටා තිබූ පොලිස් ස්ථානවලටද පහර එල්ල විය. පොලිස් නිළධාරීන් පොලිස් ස්ථාන අතහැර පසුබැසීම නිසා මුළු ප්‍රදේශයම අත්පත් කරගැනීමට ජනතාවට හැකි විය. පොලිස් භීෂණයට එරෙහි ජනතා කොමිටිය ලාල්ගාර් දිස්ත්‍රික්කයේ පාලනය භාර ගත්තේය.

ඉන්දියාවේ ජනතා දේපල රජය විසින් කොම්පැණි සඳහා මංකොල්ල කෑමද, එයට එරෙහි අරගලයද මෙසේ ඉදිරියට යමින් පවතින අතර, මේ වන විට ඉන්දියාවේ මධ්‍යම හා නැගෙනහිර ප්‍රදේශවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රදේශවාසීන් විසින් අත්පත් කරගෙන පාලනය කරති. එයට එරෙහිව ඉන්දීය රජය, ඇමරිකානු සහයෝගය ඇතිව සිය සම්පූර්ණ හමුදා බලය යොදා ජන අරගලය කුඩුපට්ටම් කර දැමීමට කටයුතු කරමින් සිටී. ඒ සඳහා වන යුද මෙහෙයුම "ඔපරේෂන් ග්‍රීන් හන්ට්" (Operation Green Hunt) නම් වේ. මෙම මෙහෙයුම පිළිබඳව ඉන්දියාවේ පාලක පන්තිය විශාල බලාපොරොත්තු තැබුවද මේ වන විට එම මෙහෙයුම අසාර්ථක වී ඇති බවද, ඒ බව මෙම මෙහෙයුමේ නියමු, ඉන්දීය ස්වදේශ ඇමති සී. චිදම්බරම් පවා පිළිගෙන ඇති බවද මාධ්‍ය වාර්තා හෙළි කරයි.

මේ ආකාරයන් ඉන්දියාවේ පෙර කලෙක නොවූ පරිදි මුළු මහත් ඉන්දීය පාලක පැලැන්තියම අර්බුදයට පත්ව සිටිති. මෙම කැරලිකරුවන් පවසනුයේ ඉන්දියාව යනු ජාතීන්ගේ හිර ගෙයක් බවත්, එනිසාම එම හිර ගෙයින් නිදහස් විය යුතු බවත්ය. මෙසේ ඉන්දියාවේ පාලක දිල්ලි කේන්ද්‍රීය බ්‍රාහ්මණ පාලක පැලැන්තියට එරෙහි අරගලය ඉන්දියාව පුරාම ව්‍යාප්ත වෙමින් පවතින අතර, මේ හේතුවෙන් ඉන්දීය දේශයම බරපතල අභියෝගයකට මුහුණ පා සිටී.

............පළමු වන පිටුවෙන්

## CIC සමාගමට.....

මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කර ඇති නැගෙනහිර උපායමාර්ගික පරිසර සංරක්ෂණ සැලැස්මේ සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන තිබෙන මෙම භූමිය විනාශ වීම කලාපයේ සංවහන වැසි සඳහා අහිතකර ලෙස බලපානු ඇති බවත්, වගා බිම් සඳහා වන වත්මන් ජල සම්පත් අහිමි වී යෑම හා විශාල රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ජලයට එක් වීම මගින් ජෛව විවිධත්වය විනාශ වීමේ අනිටු ඵල විපාක වලට මුහුණ දීමට ද සිදුවන බවත් පෙන්වා දෙන හරිත ව්‍යාපාරය දේශීය ගෙවතු කෙසෙල් වගා මගින් ආදායම් ලබන සුළු ගොවීන් ගේ වෙළෙඳපලට ද මේ ව්‍යාපෘතිය මරු පහරක් වනු ඇති බව ද පෙන්වා දී තිබේ.

මේ වනානාතර වල ඇති කළුවර, කළුමැදිරිය, පලු, මිල්ල, වීරණී තිඹිරි, වෙලන්, කරඳ, දඹ, කනුමැල්ල ආදී ශාඛ සියල්ල මේ ව්‍යාපෘතිය මගින් විනාශ කර දමනු ඇති බව ද ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය මගින් වැඩිදුරටත් පෙන්වා දෙයි.




රැවටිලිවලින් මැඩපු ජාතික අරගලය
හැත්තෑ අවේ අවි ගත්තා උතුරේ තරුණ කැළ
යකඩින් ලේවලින් වනසා තලා දමා
කඳවුරුවලට ගාල් කළා එඩිතර කෙල්ලෝ

පුනරුත්ථාපනයේ ලේබල් ටික අලවා
පුහුණුව ප්‍රකී කොම්පැණියට පඩි සුම්මා
නුඹලගේ ශ්‍රමය සූරාකෑමට දුන්නේ
ආඩම්බර තාත්තද?, ආඩම්බර බාප්පද?

ගුණෙයා විසින් එවන ලදි.

# එළ නිව්ස්

## හෙළ උරුමේ දෙබිඩ්ඩෝ

තමා විසින්ම පුරාවිද්‍යා නාමය පටබැඳගත් එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝ හෙළ උරුමයේ නායකත්වයෙන් හිටි ගමන් අයින් කරලලු. ඒ වෙලාවේ හාමුදුරුවෝ ඉඳල තියෙන්නේ මුලතිව් කැලෑවේ පරණ ගල් කැලි වගයක් බලමින්ලු. ඔන්න ඉතින් මේධානන්ද හාමුදුරුවෝ නායකත්වයෙන් ඉවත් කිරීම පිළිබඳව පැහැදිලි කරන මාධ්‍ය සාකච්ඡාවක් ළඟදි තිබ්බලු. ඒකේදී චම්පික, වර්ණසිංහ, ගම්මන්පිල පිළිවෙලින් පැහැදිලි කිරීම් කළාලු හාමුදුරුවෝ නායකත්වයෙන් ඉවත් කිරීම යුක්තිගහගත කරල. චම්පික කිව්වලු සමහර නායකයෝ ඉන්නව හැමදාම තමන්ම නායකත්වයේ ඉන්න ඕන කියලා හිතාගෙන ඉන්න. එක්කෝ රට ඉවර වෙනකම්, නැත්නම් පක්ෂෙ ඉවර වෙනකම්. අපි ඒ ප්‍රතිපත්තිය වෙනස් කළා. එකම නායකයෙක් එක දිගට පක්ෂයකවත්, රටකවත් නොසිටිය යුතුයි. නායකත්වය මාරුවෙන්න ඕන. එකයි ප්‍රජාතන්ත්‍රවාදය කියල. මෙහෙම දිගට හරහට චම්පික ඇමතිවරයා පැහැදිලි කරගෙන යනකොට එක මාධ්‍යවේදියෙක් ඇහැව්වලු චම්පික ඇමතිවරයාගෙන්, දැන් ව්‍යවස්ථාව වෙනස් කරල දිගටම ජනාධිපති පුටුවේ ඉන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ව්‍යවස්ථා සංශෝධනයක් ගේනවලු. ඔබ තුමාලාගේ මේ ප්‍රතිපත්ති අනුව ඒ ව්‍යවස්ථා සංශෝධනයටත් විරුද්ධ ඇති නේද කියල. මෙහෙම අහපු ගමන් මේසේ උඩ තිබුණු වතුර වීදුරුවක් බීගෙන බීගෙන ගිය චම්පික රණවක කිව්වලු නැහැ, ඒකේ ඇති වරදක් නැහැ. ජනතාව කැමති නම් එතුමා මැරෙන තුරුම වුණත් ජනාධිපති පුටුවේ හිටපුවාවේ. ඒ ව්‍යවස්ථා සංශෝධනයට අපි විරුද්ධ නැහැ කියලා.

## වාසුගේ ආත්ම ගෞරවය

ව්‍යවස්ථාව වෙනස් කරල ජනාධිපතිට වාර දෙකකට වැඩි කාලයක් ඉදිරිපත් වෙන්න පුළුවන් විදියට රජය ගෙනෙන්න හදන ව්‍යවස්ථා සංශෝධනයට වාසුදේව මන්ත්‍රීතුමා ඇතුළු සමසමාජ-කොමියුනිස්ට් පක්ෂ විරුද්ධයිලු. හැමදාම මේ පක්ෂවල ප්‍රතිපත්තිය වුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරල පාර්ලිමේන්තු බලය ශක්තිමත් කිරීම කියලත් වාසුදේව දිගටම ප්‍රකාශ කරල තිබුණලු. දැන් මේ කතාබහ නිසා එක දවසක් එක් විදේශීය ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ආයතනයක් වාසුදේවව ඉන්ටර්විව් කරාලු. ඒකෙදි මාධ්‍යවේදියා වාසුදේවගෙන් ඇහැවුවලු දැන් ඔබලා මේ ව්‍යවස්ථා වෙනස් කිරීම පිළිබඳව ඉන්න ස්ථාවරය මොකක්ද කියල. එක පාරටම වාසුදේව කිව්වලු අපි මුළුමණින්ම විරුද්ධයි. කිසිසේත් මේ ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දෙන්නේ නැහැ කියල. ඔන්න ඒ පාර අර මාධ්‍යවේදියා ඇහැවුවලු ඔබලාගේ විරෝධය නොතකා ආණ්ඩුව මේ ව්‍යවස්ථා සංශෝධනය කළොත් ආණ්ඩුවෙන් එළියට බහිනවද කියලා. නෑ, නෑ. අපි ආණ්ඩුවෙන් එළියට බහින්නේ හෝ ඇමතිකම් අත්හරින්නේත් නැහැ. අපේ විරෝධයත් තියාගෙන එහෙමම ඉන්නව කියල වාසුදේව කිව්වම ආයෙමත් අර මාධ්‍යවේදියා ඇහැව්වලු එතකොට ඔබතුමාලගේ ආත්ම ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් මතුවෙනව නේද? කොහොමද එහෙම යටත් වෙලා ඉන්නේ කියල. එතකොට වාසුදේව කිව්වලු අපි මේ ආණ්ඩුවට සෙට් වුණේ ආත්ම ගෞරවය පෙට්ටියක දාල, ඇණ ගහල, වහල දාල කියල.

## අයිඟා සහ සීපා

මේ ළඟදී කොළඹ පළාතේ ස්කෝලෙක සිංහල පීරියඩ් එකේදි ඔන්න එක එක ආප්තෝපදේශ ගැන කථා කරනවලු. ඒ වෙලාවේ ටීචර් කිව්වලු මම හැම එක්කෙනාගෙන්ම අහනවා. හැම එක්කෙනාම අලුත් එකක් කියන්න ඕන කියලා. ඒ කියන්නේ කලින් කියපු ආප්තෝපදේශයක් තවත් කෙනෙකුට කියන්න බැහැ කිව්වලු. ඔක්කෝටම මතක් කරගන්න විනාඩි පහක් දෙන්නම් කියලා. ඔන්න විනාඩි පහ ගිය ගමන් ටීචර් එක කෙළවරක ඉඳල පටන් ගත්තලු. දැන් පංතියේ ළමයි 20 ක් විතර එක්නෙක්වත් නෙකිකියපු අලුත් ආප්තෝපදේශයක් කියනවලු. ඉතින් මේ අතර 21 ක් වෙනියගෙන් ටීචර් ඇහැව්ව ගමන් ඒ ළමය කිව්වලු "අක්ක පෙන්නල, නංගි දුන්න වගේ කියලා". ඊළඟට ටීචර් 22 වෙනි ළමයගෙන් ඇහැව්වත් එයාට කියාගන්න බැරි වෙන කොට ටීචර් වේවැල අරගෙන පුටුවෙන් නැගිට්ටලු. එතකොට අර ළමය ඇහැව්වලු "ටීචර් අලුත්ම එකක් වුණාට කමක් නැද්ද" කියලා. එතකොට ටීචර් කිව්වලු "අලුත්ම එකක් තමයි කියන්න කිව්වේ" කියලා. අර ළමයා කිව්වලු "අයිඟා පෙන්නල සීපා දුන්නා වගේ" කියලා.

## ජ.වි.පෙ. නම වෙනස් කරලා.

පසුගිය දවසක රැස්වෙච්ච ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයේ පැය ගණනක විවාදයක් ගියාලු. මේ විවාදේ ගිහිල්ල තියෙන්නේ පහුගිය කාලේ ධනපති ආණ්ඩුත් එක්ක ගහපු ගිවිසුම් හා ඒ නායකයෝ බලයට ගෙන ඒම සඳහා කරපු වැඩකොටස් ගැනලු. ඉතිං මේවගෙ හරි-වැරදි දිගටම කථා කරගෙන යනකොට "JR ගේ ඉඳල, මහින්ද රාජපක්ෂ දක්වා අපි ධනපති නායකයන්ට මොන තරම් සපෝට් කළාද? ඒත් ඒ එකෙක් වත් අපට ඕන විදියට නම්ම ගන්න බැරි වුණානේ. දැන් අන්තිමට අපේ එවුන් මරපු ජෙනරාල් ෆොන්සේකාගේත් ලේ හොදලා අපි කරළියට අරගෙන ආවා. අන්තිමට ඌත් අපිට ඇරිය අපෙන් වැඩ අරගෙන. මේ හැම එකාටම අපි විකිණුන එකයි වුණේ. මෙහෙම ගියොත් මිනිස්සු කියයි ජ.වි.පෙ. කියන එක වෙනස් කරල ධ.වි.පෙ. කියල දාගන්න කියලා". "ඒ කතාවේ තේරුම මොකද්ද" කියල ටිල්වින් ඇහැව්වම ලාල්කාන්ත කිව්වලු "ධනපතියන්ගේ විමුක්ති පෙරමුණ" කියල.

## පිරිත් නූල අතේ තිබුණාලු

මේ ආණ්ඩුවේ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ ඇමතිකමක් දරාපු කෙනෙකුට පසුගිය කාලේ මාර වැඩක් වුණාලු. මේ ඇමතිවරයා සමඟ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ හාදකමක් පවත්වපු නෝන කෙනෙක් හිටියලු. ඉතිං ආරක්ෂකයෝ මේ වැඩේ ඉතාම රහසිගතව තියා ගත්තත් ඇමති නෝනාගේ කණට ගිහින්, දිගින්දිගටම ආරක්ෂකයන්ගෙන් ප්‍රශ්න කරන්න ගත්තලු. ඔන්න ඉංති ඔහොම ඉන්න අතරවාරෙදි දවසක් අමාත්‍යාංශයේදී ඇමතවරයාගේ පෙම්වතිය ඔහුව හමුවෙන්න ආවලු. ටික වොලවක් කථා කරකර ඉඳලා කාමරේකට රිංගල දොර වහගත්තලු. අමාත්‍යාශයේම හිටියලු ඇමතිවරයාගේ උදහසට ලක් වෙච්ච තවත් කාන්තාවක්. ඒ ඇමතිවරයාගේ යෝජනාවකට අකමැති වුණ නිසාලු. ඉතිං මේ කාන්තාව දක්කලු ඇමතිවරයයි අර පෙම්වතියයි කාමරේට වැදිල දොර වහගන්නවා. ඇය ඉක්මණින් ගිහින් රුපියල් 5 ක් දාල කෝල් එකක් අරං ඇමති බිරිඳට මේ විස්තරේ කිව්වලු. ටික වෙලාවකින් එතැනට ආපු ඇමති බිරිඳ දැකල දෙලෝ රත් වුණ ආරක්ෂකයෝ ඇයව නවත්වන්න උත්සාහ කළත් ඒක හරි ගියේ නැතිලු. ඇය කෙලින්ම දොරත් කඩාගෙන කාමරේ ඇතුළට වැදිල දිගට හරහට පහර දෙන්න ගත්තම ඇමතිවරයා උපන් ඇඳුම පිටින්ම දිව්වලු. ඔන්න ඉතිං මේක ආරංචි වෙච්ච ඇමතිවරයාගේ එක යාලුවෙක් දවසක් "මොකක්ද මචං උඹ ගැන මේ හැමතැනම කථා වෙන්නේ, ඇඟේ නූල්පොටක් වත් නැතිව දිව්වා කියලා" කිව්වම, ඇමතිවරයා කිව්වලු "ඕවා බොරු කතා බං, අතේ බැඳපු පිරිත් නූල් ඔක්කොම තිබුණ" කියල.

**අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල අඩු කරව්! වැටුප් දීමනා වැඩි කරව්!**

143, කිව් පාර, කොළඹ 02, පදිංචි ඥාණසිරි කොත්තිගොඩ වන මා විසින් කොළඹ 02, වෙලෝන් පැසේජ් හි ඔස්වින් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.